# විදේශ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020(2021)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 2223 හා 2021.04.09 දින හා අංක 2229-2021.05.21 දින පළ වූ *ගැසට්* නිවේදනයේ ''I වැනි කොටස ඃ II (අ) වැනි ඡේදය - නිවේදන යටතේ පළවූ **ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020 (2021)ට** අදාළව පහත සඳහන් **සංශෝධන සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ** අනුමැතිය ලැබී ඇත.

**සංශෝධනය**

ශ්‍රී ලංකා විදේශ සේවා විභාගය සඳහා අයදුම්පත් කැඳවමින්, ඉහත පළවූ *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය, කොවිඩ්-19 වසංගත පාලනය සඳහා දැනට පනවා ඇති සංචරණ සීමා හේතුවෙන් **2021.07.15** දින දක්වා දීර්ඝ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

තව ද, නිවේදනයේ 04 වගන්තියේ සඳහන් උපරිම වයස් සීමාවන් අංක 2223-2021.04.09 වැනි දින දරන මුල් *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට (10.05.2021) බලපැවැත්වෙන පරිදි නොවෙනස්ව පවතිනු ඇත.

අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ,
ලේකම්,
විදේශ අමාත්‍යාංශය.

2021 ජූනි මස 11 වැනි දින,
විදේශ අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01.